බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/B.Sc.Studies/EEX-13 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496<br>011-5929790 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | | විද්‍යුත් තැපැල<br>E-mail | info.ext@sjp.ac.lk |


2023-06-02

මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි

**<u>2022 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව</u>**
**<u>පාඨමාලා ගාස්තු තෙවන වාරිකය</u>**

උක්ත උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇති ඔබ විසින් පාඨමාලා ගාස්තු තෙවන වාරිකය පහත පරිදි ගෙවීම් කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

ඔබගේ ශිෂ්‍ය අත්පොතෙහි සඳහන් පරිදි පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර පාඨමාලා ගාස්තු තෙවන වාරිකය ගෙවීම කල යුතු අතර **<u>විභාගයට පෙනී සිටීමට වාරික 3ම ගෙවා සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.</u>** ඒ අනුව 2022 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය 2023 ඔක්තොම්බර් මස ආරම්භවීමට නියමිත බැවින් මුදල් ගෙවිය යුතු අවසන් දිනට පෙර ගෙවීම් කළ යුතුය.

| | |
|---|---|
| **පාඨමාලා ගාස්තු තෙවන වාරිකය ගෙවිය යුතු ගිණුම් අංකය** | www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය “V” අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| **<u>පාඨමාලා ගාස්තු</u>**<br>**තෙවන වාරිකය** | **රු.50 000.00** |
| **තෙවන වාරිකය සඳහා මුදල් ගෙවිය යුතු අවසන් දිනය** | **2023-08-31** |
| **අයදුම්පත සහ රිසිට්පත යොමු කළ යුතු ආකාරය** | සම්පූර්ණ කරන ලද අයදුම්පත හා රිසිට්පතෙහි පැහැදිලි පිටපත් (Scanned copy) අදාළ දිනට පෙර reg.edecu@sjp.ac.lk යන විද්‍යුත් ලිපිනයට එවිය යුතුය. (අදාළ ලේඛන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමේදී **2022 B.Sc. Business Studies (General) External Degree – 3rd Installment – Reg No** (ඔබගේ ලියාපදිංචි අංකය) ලෙස සඳහන් කර එවීම අනිවාර්යය වේ.) |

<u>ඔබගේ විශේෂ අවධානයට</u>

1. පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂි ගිණුම් අංකයක් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **වෙනත් ගිණුම් අංකවලට ගෙවනු ලබන මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය විසින් වග කියනු නොලබන බව කරුණාවෙන් සලකන්න.**
**(එහි ජායා පිටපතක් ළඟ තබා ගන්න)**

2. **විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්, නියමිත පරිදි මුදල් නොගෙවන ලද අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**



සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය